# 02. භෞතික පසුබිම



## 2. භෞතික පසුබිම

### 2.1 භූ විෂමතාවය

ශ්‍රී ලංකාවේ නිරිත දිග වෙරළබඩ පහත් තැන්නෙහි පිහිටා ඇති බැවින්, සාමාන්‍යයෙන් එය කැපී පෙනෙන විෂමතා රහිත තැනි බිමක් ලෙස දැක්විය හැකිය. භූමියේ සාමාන්‍ය උස මීටර 30. 5ට අඩු වන අතර, නැගෙනහිර දෙස සිට බටහිර සාගරය දෙසට භූමියේ බෑවුම් දිස්වේ. විශේෂිත කඩතොලු රහිතව විහිදෙන සාමාන්‍ය වෙරළක් මෙම කලාපයේ දක්නට ඇත.

<u>**බෑවුම් කලාපය**</u>

1:50.00 භූ විෂමතා සිතියම මත පිහිටා සකසා ඇති බෑවුම් කලාප සිතියම අනුව මෙම ප්‍රදේශයේ කැපී පෙනෙන බෑව්ම් කලාප විද්‍යාමාන නොවේ. වෙරළබඩ හෝ තැනි බිම් ප්‍රදේශයක් වීම නිසා මෙම කොට්ඨාසයේ බෑව්ම් ප්‍රතිශතය 8% කට වඩා අඩු මට්ටමක පවතී. ඒ අනුව පෙනී යන්නේ පවත්නා භූමියෙන් 100% හෙවත් මුළු වර්ග ප්‍රමාණයම (හෙක්ටයාර් 842) තැනි සහිත ස්වරූපයක් ගන්නා බවයි.

බෑවුම් කලාප ගණනය කිරීමේ ක්‍රමය මත එය ප්‍රධාන කොටස් 5 කට බෙදනු ලැබේ. එනම්,

0 - 8%

8 - 16%


16 - 30%

30 - 60%

60 වැඩි


මේ අනුව පහත වගුව තුලින් බෑව්ම් ප්‍රතිශත අගය මත දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෑවුම් කලාප බෙදීගිය ආකාරය දැක්වේ.

| බෑවුම් කලාප | බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) |
|---|---|
| 0 - 8% | 842.00 |
| 8 - 16% | 000.00 |
| 16 - 30% | 000.00 |
| 30 - 60% | 000.00 |
| 60 වැඩි | 000.00 |


AGRO ECOLOGICAL ZONES
DS Division Dehiwala
N
99000
100000
101000
102000
186000
185000
184000
183000
182000
1:20,000
Legend
WL3 - Wet Zone Low Country
DS DEHIWALA
PREPARED BY LAND USE PLANNING OFFICE - COLOMBO

## 2.2 ජලවහන රටාව

**STREAM NETWORK / IRRIGATION CANNEL & FLOOD AFFECTED AREA.**



## 2.3 පාංශු ව්‍යාප්තිය

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාංශු වර්ගීකරණය දෙස බලන විට එය කාණ්ඩ 03ක් යටතේ හඳුනා ගත හැකි වන්නේය.

01 මෘදු හෝ තද ලැටරයිට් සහිත පස - රතු කහ පොට්සොලික් පස.

02 වගුරු සහ අර්ධ වගුරු පස.


03 රෙගසෝල් පස.

මෙම වර්ගීකරනය අනුව ප්‍රදේශයේ විශාල වර්ග ප්‍රමාණයක් පුරා ව්‍යාප්තිව පවතිනුයේ මනා ජලවහනයක් දක්වන්නා වූ රතු කහ පොට්සොලික් පසය. එය මෘදු හෝ තද ලැටරයිට් පස සමග මිශ්‍රව පවතී. රැලි බිම් සහිත ප්‍රදේශ ආශ්‍රයෙන් ව්‍යාප්තව පවත්නා පාංශු බාණ්ඩය වෙරළ තීරයෙන් ඈත්ව රට අභ්‍යන්තරයට කෙටි දුරක් ව්‍යාප්තව පවතී. භෝග වගාවට ඉතා වැදගත් වුවද, පසේ " A " ස්ථරයේ ඝණත්වය අඩුය. සෝදාපාළුවට ලක් වීමේ ප්‍රතිඵලයක් ලෙස එය සිදු වී ඇත.

සිතියම අනුව අර්ධ වගුරු හා වගුරු පස දක්නට ලැබෙන්නේගිණිකොණ දිග ප්‍රදේශ ආශ්‍රයෙනි. කච්ඩාන නැගෙනහිර (539/42B) වසම මෙම පාෂාණ ශ්‍රේණියට අයත් අතර නැදිමාල (536) වසමෙහිද, ඉතා සුළු වශයෙන් ව්‍යාප්තව පවතී. මෙම පාංශු වර්ගය දුර්වල ජලවහනයක් පෙන්වයි. එමෙන්ම මතුපිට ස්ථරයද තදදුඹුරු හෝ කලු පාටින් යුක්තය. මෙම ප්‍රදේශයේ අර්ධ වගුරු ස්වරූපයක් ගන්නා ප්‍රදේශ වී වගාවට සුදුසුය.

මද බෑවුම හා තැනිතලා ස්වරූපයකින් යුත් ප්‍රදේශවල හා වෙරළ තීරය ආශ්‍රිත ප්‍රදේශවල දක්නට ලැබෙන්නේ රෙගසෝල් පසය. දෙහිවල ඇළ මාර්ගයෙන් ආරම්භ වී වෙරළ තීරයට සමාන්තරව දකුණට ව්‍යාප්තවීමක් මෙහි දක්නට ඇත.

සෙසු පාෂාණ කාණ්ඩ සමග සංසන්ධනාත්මකව බලන විටදී ප්‍රදේශයේ කෘෂිකාර්මික බෝග ව්‍යාප්තියක් නොවුවද, රතු කහ පොට්සොලික් පස මෙන් මෙම පාංශු කාණ්ඩ වගාවට හිතකර බවක් නොපෙන්වයි. මෙය ජලය රදා පවත්වා ගැනීමට අපහසු රළු වයනයකින් යුත් පසක්වශයෙන් පවත්නා අතර, තෙත් කලාපයේදී පොල් වගාවට හිතකර, ඉදිකිරීම් කටයුතු සඳහා ද එතරම් යෝග්‍ය නොවූ පසක් වශයෙන් පවතී. මීටර් 3ක් පමණ ගැඹුරට මේ පස විහිදේ. කොට්ඨාසයේ මාර්ග සිතියමට අනුව දක්නට ලැබෙන්නේ වර්තමාන භූමි පරිහරණය තුළ ප්‍රධාන මහා මාර්ගය, ප්‍රධාන දුම්රිය මාර්ග පද්ධතිය මෙම පාංශු කාණ්ඩය තුල ව්‍යාප්තව පවත්නා බවයි.


SOIL MAP
DS Division Dehiwala
N
99000
100000
101000
102000
186000
185000
184000
183000
182000
1:20,000
Legend
Bog and Half-Bog soils; flat terrain
Red-Yellow Podzolic soils with soft or hard laterite; rolling and undulating terrain
Regosols on Recent beach sands; flat terrain
DS Division Boundary
PREPARED BY LAND USE PLANNING OFFICE - COLOMBO

## 2.4 ඛනිජ සම්පත්

පැහැදිලිව හඳුනා ගත හැකි ඛනිජ සම්පතක් මෙම ප්‍රදේශයේ නොමැත.

## 2.5 දේශගුණය

දෙහිවල කොට්ඨාසයේ මූලික වශයෙන් දක්නට ලැබෙන්නේ නිවර්තන සහ මෝසම් දේශගුණික ලක්ෂණය. මධ්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙල්සියස් අංශක 27.5ක් වන අතර, මධ්‍ය වාර්ෂික වර්ෂාංකනය මිලිමීටර් 2000 – 3000 අතර වේ. නිරිත දිග මෝසම් සුළං වල වාර්ෂික බලපෑමට මෙම ප්‍රදේශය ගොදුරු වේ.

මෙම කොට්ඨාසයේ වාර්ෂික වර්ෂාපතනයෙන් 50%ක් පමණ නිරිත දිග මෝසම් සුළං ආශ්‍රයෙන් ලැබේ. අන්තර් මෝසම් සුළං කාල දෙකේදී සංවහන ධාරා බලපැවැත්වීමෙන් විශේෂයෙන් සවස් කාලයේදී සැළකිය යුතු වර්ෂාංකයක් ලැබේ. ඊසාන දිග මෝසම් සුළං කාලයේදී සාපේක්ෂ වශයෙන් අඩු වර්ෂාපතනයක් ලැබේ.

## 2.6 ස්වාභාවික වෘක්ෂලතා

මෙම ප්‍රදේශයේ ජනාකීර්ණ බව නිසාම ස්වාභාවික වෘක්ෂලතා ගණයේලා සැලකිය හැකි වනාන්තර කිසිවක් නොමැති අතර ස්වාභාවික නොවන වෘක්ෂලතා ලෙස සැලකෙන වෘක්ෂලතාවලින් වී,පොල්,කටු අනෝදා වැනි කෘෂි බෝග කිහිපයක් පමණක් ඇත.


## 2.7 ඉඩම් පරිහරණ

| භූමිය යොදාගෙන ඇති ආකාරය | හෙක්ටයාර් ප්‍රමාණය |
|---|---|
| 1. සංවර්ධනය වු ඉඩම් | 783 |
| 2. තෙත් බිම් | 16 |
| 3. ජලාශ්‍රිත ප්‍රදේශ | 28 |
| 4. වෙනත් ඉඩම් | 15 |
| | 842 |

- දිස්ත්‍රික් පරිහරණ සැලසුම් කාර්යාලය - කොළඹ මගින් කරන ලද GIS ගණනය කිරීම් අනුව කොට්ඨාසයේ භූමි ප්‍රමාණය හෙක්ටයාර් 842 ක් බව සඳහන්කර ඇත.

මූලාශ්‍රය: ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි.

## ඉඩම් පරිහරණ



LAND USE MAP 2016
DS Division Dehiwala
99000
100000
101000
102000
186000
185000
184000
183000
182000
181000
537
537 A
537 B
538C
538A
538
538 B
540 A
540
536 A
536
539/42 A
540B
539/42
539/42 B
1:20,000
Legend
Urban Areas
Industrial Sites
Playground
Park
Cemetery
Scrub Land
Marsh
Canals
Lake
Water Hole
Sandy Area
Unutilized Lands
GN Division Boundary
PREPARED BY LAND USE PLANNING OFFICE - COLOMBO